# Path to Success - study pack

## තෙවන පාසල් වාරය සඳහා ඉගෙනුම් අත්වැල

## කතෝලික ධර්මය - 09 ශ්‍රේණිය



අධ්‍යාපන සංවර්ධන අංශය

කලාප අධ්‍යාපන කාර්යාලය - කැලණිය

**අධීක්ෂණය හා මඟ පෙන්වීම**

පී සී ඉරෝෂිණී කේ පරණගම මිය - කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ

ඒ එෆ් ජේ පී සිල්වා මයා - නියෝජ්‍ය කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ ( සංවර්ධන )

**මෙහෙයවීම**

පූජ්‍ය දබෝරේ පියරත්න හිමි - සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ ( ආගම )

**සැකසුම**

පි ඩි ෆිලිෂියා අයිරින් - කතෝලික ධර්මය ගුරු උපදේශක ( කැලණිය කලාපය )

කේ ඒ ඩී ඩී ස්වර්ණලතා නානායක්කාර - බප/කැල සාන්ත සෙබස්තියන් මහා විද්‍යාලය එඬේරමුල්ල

එම් චමින්ද ප්‍රියදර්ශන පීරිස් - බප/කැල විද්‍යානි විද්‍යාලය

එස් එන් සී ඩී ඩයස් - බප/කැල රෝමානු කතෝලික විද්‍යාලය කඩවත

# 18 පාඩම - කාමමිථ්‍යාචාරය නොකරව



දේව ස්වරූපයට අනුව මැවූ මනුෂ්‍යා පරිශුද්ධය. විවාහය දේව ප්‍රසාද නිධානයක් බැවින් ස්ත්‍රිය සහ පුරුෂයා එකිනෙකා කෙරෙහි ප්‍රේමයෙන් කැප වී සිටිය යුතු බව ශු ලියවිල්ල පසක් කර දෙයි. විවාහය ප්‍රේමයේ උත්තරීතර ඵලය වන අතර එම උත්තරීතර බව ආරක්ෂා කිරීමට ඔවුන් බැඳි සිටියි. එම නිසා අප වචනයෙන් ක්‍රියාවෙන් බැල්මෙන් මෙන්ම සිතුවිලි වලින්ද පිරිසිඳු විය යුතුය. අපගේ ශරීරය ශුද්ධාත්මයාණන් වහන්සේගේ දේව මන්දිරය බැවින් අප අපගේ ශරීරය ශාරීරිකව මෙන්ම අධ්‍යාත්මිකට පිරිසිදුව තබා ගත යුතුයි.

1) 6වන පණත ආරක්ෂා කළ හැකි ආකාර 5ක් ලැයිස්තු ගත කරන්න.

2) පාරිශුද්ධ පිවිතයක් ගත කිරීමට ඔබ කුමක් කළ යුතු දැයි විග්‍රහ කරන්න.

3) පාපයට පෙළඹුණු ඔබගේ මිතුරෙකුට හෝ මිතුරියකට ඔබට දිය හැකි උපදෙසක් ශු බයිබල් පාඨයක් ඇසුරෙන් ලියා දක්වන්න.

4)අද සමාජයේ නොමඟ ගිය තරුණ පිරිස් වෙනුවෙන් නිර්මාණශිලි යාච්ඤාවක් ලියා දක්වන්න.

5) සියලුම දෙනාට සහෝදර ප්‍රේමයෙන් සලකමු
ඉහත මාතෘකාව ඔස්සේ කරුණු 10ක් පෙළගස්වන්න

6) ශරීරය යනු කාමමිථ්‍යාචාරයේ එක් අවියක් නොවන බවත් එය ශුද්ධාත්ම මන්දිරයක් වන බවත් සනාථ කරමින් පුවත්පතකට ලිපියක් සකස් කරන්න

7) පහත සඳහන් කරුණු තුළින් පිවිතුරු දිවියකට රුකුලක් වන දේවල් පමණක් තෝරා ලියන්න

යාච්ඤා කිරීම

ශරීරයට ගරු කිරීම

අසභ්‍ය චිත්‍රපටි බැලීම

අනුන් වරදට පෙළඹවීම

හැකි හැම විටම දිව්‍ය පූජාවට සහභාගි වීම

සැමදෙනාටම සහෝදර ප්‍රේමය දැක්වීම

පවුලක් ලෙස ජපමාලය උච්චාරණය කිරීම

# 19 පාඩම - පරදාල ආලය නොකරව



මිනිසා යනු ආත්මයකින් හා ශරීරයකින් යුක්ත වූ දේව මැවිල්ලකි. පාපය මිනිසාට උරුම වූ දෙයක් බැවින් එයින් මිදීමට අපට ශුද්ධාත්ම වරම් අවශ්‍ය වෙයි. පිවිතුරු සිතුවිලිවලින් හෙබි මිනිසා සමාජයට විශාල සේවයක් කරන අතර ඔහු හෝ ඇය දෙවියන් වහන්සේ ඉදිරියෙහි ප්‍රසන්න දරුවෙක්ද වන්නේය. අපි සැම විටම දේව ආදරය මගින් අපගේ ආකල්ප පිවිතුරු කරගෙන මිනිසත් බවේ අභිමානය සවිමත් කිරීමට කටයුතු කළ යුතුයි.

1) ක ස ධ 2521 ට අනුව හැගිම් පාලනය කර ගැනිමේ එක් ගුණාගංයක් දක්වන්න

2) නවවන පණතින්  අපට ලබා දෙන උපදෙස කෙටියෙන් පහදන්න

3) නවවන පණතට විරුද්ධව කරන පාපයක් ලියා දක්වන්න

4) හෙරෝද් ඇන්ටිපස් කළ වරද ඔහුට පෙන්වා දුන් ස්නාවක ජෝහාන් තුමාගෙන් අපට ගත හැකි ආදර්ශය ලියා දක්වන්න

5) පිවිතුරු දිවියක් ගත කරන්නට අප විසින් කළ යුතු දේවල් 6ක් ලැයිස්තුගත කරන්න.

6) ව්‍රත ශුද්ධිය රැක ගැනීම සඳහා දේව රැකවරණය පතා යාච්ඤාවක් නිර්මාණය කරන්න.

7) නවවන පනත ආරක්ෂා කරන්නට මරිය උත්තමාවිය අපට ලබා දෙන ආදර්ශය පැහැදිලි කරන්න.



## 20 පාඩම - පිවිතුරු ජීවිතාදර්ශ

1) පිවිතුරු ජීවිතයක් ගත කරමින් අපට මහගු ආදර්ශයක් දුන් සාන්තුවර චරිත 3ක් ලියා දක්වන්න.

2) ශු. මරිය ගොරෙත්ති මුනිවරිය පිළිබඳ පහත සඳහන් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න

1) උපන් වර්ෂය

2) උපන් රට

3) මව සහ පියාගේ නම

4) පියාගේ මරණින් පසු ඇය පවුලේ වගකීම් ඉටු කළ ආකාරය

5) ඇයව 6වන පණතට විරුද්ධව පව් කිරීමට පොළඹවීමට පැමිණි පුද්ගලයා

6) ඇයගේ මරණයට හේතුව

7) මරණයට පෙර ඇයගේ අවසන් වදන්

8) මිය යන විට ඇයගේ වයස

9) ශු මරිය ගොරෙත්ති මුනිවරියගේ මංගල්‍යය දින

10) ඇයගෙන් අපට ලබා ගත හැකි ආදර්ශය



3) ශුද්ධවු ඇග්නස් මුනිතුමිය පිළිබඳ පහත සටහන් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න

1) මෙතුමිය කුඩා කාලයේ ජිවත් වූ ආකාරය

2) වයස අවුරුදු 12 සිදුවූ විශේෂ සිදුවිම

3) එතුමිය විවාහ කරගැනීමේ අරමුණින් වටිනා තෑග්ගක් එවූ පුද්ගලයා

4) එම අවස්ථාවට එතුමිය දක්වන ලද ප්‍රතිචාරය

5)එතුමියගේ ප්‍රතිචාරයට හිමි වූ දඬුවම

6) සියලු වද හිංසා වලින් එතුමිය බේරාගැනීමට පොරොන්දු වූ පුද්ගලයා

7) ඔහුගෙන් එතුමියට ලැබුණු යෝජනාව

8) එය ප්‍රතික්ෂේප කරමින් එතුමිය දුන් පිළිතුර

9) එතුමිය මරණයට පත් වූ ආකාරය

10) එතුමියගේ මංගල්‍ය දින



4) ශුද්ධවූ දොමිනික් සාවියෝ මුනිතුමා පිළිබඳ පහත සඳහන් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න

**1) එතුමාගේ උපන් දිනය හා වර්ෂය**

**2) උපන් රට සහ ග්‍රාමය**

**3) දෙමව්පියන්ගේ නම්**

**4) එතුමා වයස අවුරුදු 7දී කළ ඉල්ලීම**

**5) එම ඉල්ලීමට පියතුමාගෙන් ලැබුණු ප්‍රතිචාරය**

**6) එතුමාගේ ජීවිතයෙන් ගත හැකි ආදර්ශය**

**7) එතුමාගේ ස්වර්ගස්ථ වූ දිනය**

**8) එතුමාගේ අවසන් වදන්**

**9) එතුමාගේ මංගල්‍යය දින**

**10) එතුමාගේ කොළ පාට බෙන්තිස්සුව නිසා සිදු වූ ප්‍රාතිහාර්යය**



## 21 පාඩම - ඉල්ලන්නාට දෙනු ලැබේ





1) එලියා දිවැසිවරයා යාගයක් සුදානම් කළ කන්ද කුමක්ද?

2) එලියා දිවැසිවරයා යාගයට ජලය වත් කර දෙවියන් වහන්සේට කළ යාච්ඤාවේ අන්තර්ගතය කෙටියෙන් ලියා දක්වන්න.

3) එම යාගයෙන් පසු සිදුවූ ස්වභාවික විපර්යාසය කුමක්ද?

4) එම සිදුවීමෙන් අපට ගත හැකි පණිවුඩය ලියා දක්වන්න

5) ශු. ජුසේවාස් පියතුමා මහනුවර සිරගතව සිටි කාලයේ රජරට පාලනය කළේ කවුරුන්ද?

6) එහිදී ශු. ජුසේවාස් මුනිතුමා විසින් සිදු කරන ලද ප්‍රාතිහාර්යය කෙටියෙන් ලියා දක්වන්න

7) ශු. ජුසේවාස් පියතුමා මඟින් අපට ගත හැකි ආදර්ශය ලියා දක්වන්න

# 22 පාඩම - යහපත් දේ අයදිමු



ප්‍රසාද ස්නාපනය මඟින් කතෝලිකත්වය ලබන අපට ජීවිත දෙකක් ඇත. එනම් ලෞකීක ජීවිතය හෙවත් කෙටිකාලීන ජීවිතය හා සදාතන ජීවිතය හෙවත් සදාකාලික ජීවිතයයි. අපගේ එදිනෙදා යාච්ඤාවේදි තමාගේ මෙන්ම අන් අයගේද යහපත උදෙසා යාච්ඤා කිරීමට අපි යොමු විය යුතුයි. යාච්ඤාව යනු හුදෙක් වචන වලට පමණක් සීමා නොවී ආධ්‍යාත්මිකව දෙවියන් වහන්සේ සමග සංවාදයේ යෙදීමය. යාච්ඤාව තුළ අපගේ ජීවිතයට අපට බහුල වරප්‍රසාද හිමිකරගැනීමට හැකි අතර එහිදි විශේෂාකාරයෙන් අන් අය උදෙසා ද යාච්ඤාව කිරීම අපගේ යුතුකමකි.

1) සලමොන් රජු හට දෙවියන් වහන්සේ දර්ශනය වූ ස්ථානය නම් කරන්න

2) එහිදි සලමොන් රජතුමා දෙවියන් වහන්සේගෙන් කළ ඉල්ලීම කුමක්ද?

3) සලමොන් රජතුමාගේ ඉල්ලීමෙන් අපට ගත හැකි ආදර්ශය කුමක්ද?

4) ප්‍රඥාව යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද?

5) අපගේ එදිනෙදා ජීවිතයේදි ප්‍රඥාවෙන් කටයුතු කළ යුතු අවස්ථා 3ක් ලියන්න

6) ලෞකීකත්වයෙන් ඈත්වී ජේසුස් වහන්සේ තුළින්ම සදාතනික ජීවිතය කරා ළං වීමට අප කුමක් කළ යුතුද?

7) කොරොනා වසංගතය හේතුවෙන් පීඩා විඳින ලෝකවාසී සියලුම දෙනා වෙනුවෙන් සුවය පතා යාච්ඤාවක් ලියා දක්වන්න



# 23 පාඩම - උදාන ගී



මරියොත්තමාවිය, ජේසු සමිඳුන් කුස පිළිසිඳගැනීමත් සමඟම දෙවියන් වහන්සේට ස්තුති ප්‍රශංසා කළාය. එතුමිය ආදර්ශ කරගනිමින් අප සැම විටම ලද සියලු දේ සඳහා දෙවියන් වහන්සේට ස්තුති ප්‍රශංසා කළ යුතුයි.

1) හිස්තැන් පුරවන්න

මරියතුමිය විසින් ……………..තුමිය බැහැ දැකීමට ගියාය

සෙකරියස් තුමාගේ ගෙට ඇතුළු වී …………….. තුමියට ආචාර කළාය

එතුමියගේ කුසෙහි ……………..ඉපිලෙන්නට විය

එළිසබෙත් තුමිය…………….. වහන්සේගෙනේ පූර්ණ විය

2) මරිය තුමියගේ උදාන ගීය සටහන් කරන්න

3) ශු.ලූක් තුමාට අනුව සෙකරියස් තුමාගේ ප්‍රශංසා ගීතය හා සබැඳි සුවිශේෂී සිදුවීම ලියා දක්වන්න



4) සෙකරියස් තුමාගේ ප්‍රශංසා ගීතයෙහි දක්නට ලැබෙන සුවිශේෂී කරුණු 2ක් ලියන්න

5) ළදරු ජේසුස් වහන්සේ වත් පිළිවෙත් ඉටු කරනු වස් දේව මාළිගයට ගෙන ආ කළ උන්වහන්සේව දෝතින් දරා දෙවියන් වහන්සේට ප්‍රශංසා කළේ කවුරුන්ද? එතුමා කළ ප්‍රශංසා ගීතය ලියා දක්වන්න.

# 24 පාඩම - යාච්ඤාවේ ප්‍රභේද



යාච්ඤාව යනු මිනිස් ආයාචනා දෙවියන් වහන්සේ වෙතටත් දේව කැමැත්ත මිනිසා විසින් වටහා ගන්නටත් යොමු වන සංවාදයකි. ක්‍රිස්තියානි යැඳුම් සම්ප්‍රදාය තුළ විවිධ ප්‍රභේද දක්නට ඇත.

1) ක්‍රිස්තියානි යැඳුම් සම්ප්‍රදාය තුළ යාච්ඤාවේ ප්‍රභේද 3 ලියන්න.

2) වාචික යැඳුම යනු කුමක්දැයි ලියා එයට උදාහරණ 3ක් දක්වන්න.

3) භාවනාව යනු කුමක්ද?

4) භාවනාවේදී විමසිලිමත් වන කරුණු 2ක් ලියා දක්වන්න.

5) ධ්‍යානයට සමවැදිම යනු කුමක්ද?

6) ශාන්ත තොරේසා මව්තුමිය ධ්‍යානයට සම වැදිම පිළිබඳව දැරූ අදහස ලියා දක්වන්න.

7) අසීසයේ ශු ෆ්‍රැන්සිස් මුනිතුමාගේ යාච්ඤාවේ අඩංගු මූලික කරුණු 2ක් ලියා දක්වන්න.

8) දිනපතා යාච්ඤාවට අවශ්‍ය මුලිකාංග 3ක් ලියන්න.

9) යාච්ඤාව තුළ අපට ලැබෙන දේව වරප්‍රසාද 5ක් පැහැදිලි කරන්න.

10) කිතුණුවන්ගේ අධ්‍යාත්මික ජිවිතය පරිපෝෂණය වන්නේ යාච්ඤාව මඟිනි .
ඉහත කරුණු සනාථ කරමින් පුවත් පතකට ලිපියක් සකසන්න



# 25 පාඩම - අසිපා



1) අසිපා යන්නෙහි අර්ථය කුමක්ද?

2) අසිපා ඉතිහාසය හා පසුබිම කෙටියෙන් සටහන් කරන්න.

3) කුඩා කිතුණු සංඝ තුළ සුපුවත බෙදා ගැනීමේ හත් පියවර කෙටියෙන් පහදන්න.

4) අසීපා ආරම්භ කළේ කුමක් සඳහාද?

5) ඔබ වඩාත් කැමති ශු. ලියවිලි පාඨය පහත සඳහන් ශු බයිබලය තුළ ලියන්න

